කොවිඩ්-19 වාර්තාකරණය සඳහා රජය මගින් ඉදිරිපත් කොට ඇති නිර්දේශයන්හි, ජන මනසට ආතතිය සහ ඉච්ඡාභංගත්වය ඇති නොවෙනා ආකාරයෙන්, ධනාත්මකව හා බලාපොරොත්තු ඇතිකරවන ආකාරයෙන් පුවත් වාර්තාවන් හා දැනුවත් කිරීම් ලබාදෙන ලෙසින් පැවසේ. එවැනි නිර්දේශයන් හඳුන්වා දීමේ එක් අරමුණක් වන්නේද, කොවිඩ්-19 තත්වය සමගින් විශාදයට පත් වීම සහ එහි දිගුවක් ලෙසින් යමෙකු දිවි අහිමි කරගන්නා තැනට යෑම වැළැක්වීමයි.

එනිසා, මාධ්‍ය මගින් දිවි අහිමි කරගැනීම් වාර්තාකරණය සඳහා හඳුන්වා දී ඇති ආචාර ධර්මයන් හා නිර්දේශයන් එම අදාළ පුවත් වාර්තාවන් හා ලිපි පළ කිරීමේදී පිළිපැදීම අතිශයින්ම වැදගත් වේ.

සති අග අරුණ (11/15) පුවත්පතේ පළවූ "මළාට පස්සේ පොසිටිව් වෙන්නේ කොහොමද" යන මැයෙන් යුතු ලිපියක් මෙහිදී ගත හැක. මෙම ලිපිය කොවිඩ්-19 හා බැඳුණු අපහසුතාවයන්, කොවිඩ්-19 තත්වය අතර ජනතාවගේ මානසික තත්වයන්, කොවිඩ්-19 හා බැඳුණු මානසික පීඩනය ඔස්සේ දිවි අහිමි කරගැනීම් යනාදී කරුණු ආවරණය කොට තිබේ.

මෙය සෘජුවම දිවි අහිමි කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවක් හෝ ඒ පිළිබඳව පමණක් සාකච්ඡා කරනා ලිපියක් නොවූවත්, මෙහි දිවි අහිමි කරගැනීමක් සිදුවූ ආකාරය පළ කළ යුතුද? ඒ ඔස්සේ අනුකාරක දිවි අහිමි කරගැනීම් වලට උත්ප්‍රේරණයක් ලැබීමේ ඉඩක් නැතිද? එසේම මෙවැනි ලිපියක් සමගින් උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවයක් ඇති තවත් අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමේ ඉඩක් නොතිබේද?

උපකාරක අංක:

*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926
**#MediaEthicsSL #lka #SinhalaPress #SathiAgaAruna**